# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2000 අංක 11 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 04 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 මැයි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**2000 අංක 11 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 04 වන දින]

එල්.ඩී.-ඕ. 45/98

**1992 අංක 64 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනයේ නාමය සංශෝධනය කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් ඒ ආයතනය විසින් සම්මත කොට ගෙන ඇති හෙයින් ද, ඒ යෝජනා සම්මතය ක්‍රියාත්මක කිරීම සඳහා ඒ ආයතනයේ නාමය වෙනස් කිරීමට ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීමට ඉඩ දීම සුදුසු හෙයින් ද ; පූර්විකාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මෙම පනත 2000 අංක 11 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1992 අංක 64 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ හෝ ඒ පනත යටතේ සාදනු ලැබූ යම් රීතියක, නිකුත් කරන ලද යම් දැන්වීමක හෝ වෙනත් ලේඛනයක හෝ, ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය සම්බන්ධයෙන් (එකී නාමයෙන් හෝ "ආයතනය" යන කෙටි නාමයෙන් හෝ) සඳහන් කර ඇති සෑම පද සම්බන්ධයක දී ම, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය" යන යෙදුම වෙනුවට "ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවන්ගේ ආයතනය" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය. 1992 අංක 64 දරන පනතට අනුව කරනු ලබන සාමාන්‍ය සංශෝධන.

3. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ශ්‍රී ලංකා ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ආයතනය විසින් හෝ එහි නමට හෝ සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ සෑම කොන්ත්‍රාත්තුවක් ම, ගිවිසුමක් ම හෝ වෙනත් කවර වූවද සාධන පත්‍රයක්, සහතිකයක් නැතහොත් ලේඛනයක් ම මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන්පසු ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවන්ගේ ආයතනය විසින් හෝ එහි නමට හෝ සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ කොන්ත්‍රාත්තුවක්, ගිවිසුමක්, සාධන පත්‍රයක්, සහතිකයක් හෝ ලේඛනයක් සේ සලකනු ලැබිය යුතු ය. ගිවිසුම් ආදිය සඳහා ආරක්ෂාව.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.